# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,724 — 1966 දෙසැම්බර් 2 වැනි සිකුරාද — 1966.12.2

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... | 233 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | 234 | | |


## වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාල සියලුම ලියුම් කියුම් කොළඹ 1, ඇව්ලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරි දිනකම දහයේ සිට හතර දක්වාද, සෑම වරුවේ දිනවල දහයේ සිට එක දක්වාද ලේඛණ පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරි දිනවල සවස 3 දක්වාද, වරුවේ දිනවල දවල් 12 දක්වාද භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළෙඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් (වෙළෙඳ ලකුණු ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ) කවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකයද දක්වනු ලැබේ.

### "ඒ" කොටසේ හෝ "බී" කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ "ඒ" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්‍යාලයීය අංකය සමග දක්වනු ලැබේ. රෙජිස්ටරයේ "බී" කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්‍යාලයීය අංකයට මුලින් "බී" අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම පසුවරෙහි පළවී ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1966 ජූලි මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළත දී රුපියල් 25 ක අවලංගු නො කරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග ටී. ඇම්. 7 දරන ෆෝර්ම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසුයැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාලසීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නො කළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නො කළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සළකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්යය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

---

## පේටන්ට් බලපත්‍ර ආඥපනත යටතේ නිවේදන

### දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**1964 නොවැම්බර් 9 වැනි දින දරන අංක 5526. (ජර්මනියේ අංක F41266 දරන පේටන්ට් බලපත්‍රයේ 63.11.13 පූර්වතා දිනයට හිමිකම් පාන සම්මුති ඉල්ලුම් පත්‍රය)**

FARBENFABRIKEN BAYER AKTIEN GESELLS CHAFT

'' දිලීරනාශක සංයුති ''

**සංක්ෂේපය.**—මෙම නව නිර්මාණයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කරගත හැකි වේ :—

වී වගාවල හටගන්නා දිලීර රෝග පාලනය කිරීම පිණිස ගන්නා මෙ දිලීරනාශක සංයුතිවල සක්‍රිය සංඝටක වශයෙන් (1) බ්ලාස්ටිසයිඩින් S ද (2) 1, 2–ප්‍රොපිලීන්—බිස්—ඩයිතයෝකාබමික් අම්ලයේ ලවණයක් ද, විකල්ප වශයෙන් (3) දිලීරනාශක කාබනික රසදිය සංයෝගයක් ද අන්තර් ගත වේ.

හිමිකම් ප්‍රකාශ 6 ක් ද නිදසුන් 1 ක් ද මෙහි ඇතුළත් වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ත්‍රාර්.

1966 සැප්තැම්බර් 23 වැනි දින,
කොළඹ දීය.

12—958/1

---

### දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**1964 දෙසැම්බර් 23 වැනි දින දරන අංක 5548. (ජපානයේ අංක 70597/63 දරන පේටන්ට් බලපත්‍රයේ 63.12.26 පූර්වතා දිනයට හිමිකම් පාන සම්මුති ඉල්ලුම් පත්‍රය)**

SUMITOMO CHEMICAL COMPANY LTD

'' පළිබෝධනාශක සංයුති ''

**සංක්ෂේපය.**—මෙම නව නිර්මාණයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කරගත හැකි වේ :—

මෙම පළිබෝධනාශක සංයුතියෙහි, ටර්පින් තෙල් සහ පයින් තෙල් යන මෙවායින් සමන්විත කාණ්ඩයෙන් තෝරා ගත් අඩු ගණනේ එක සංයෝගයක් වත් ද අත්‍යවශ්‍ය සක්‍රිය සංඝටකය වශයෙන් ගැනෙන O, O—ඩයිමෙතිල්—O—(3—මෙතිල්—4—නයිට්‍රොපෙනිල්) පොස්පොරොතයොයේට යෙන් සහ O, O—ඩයිමෙතිල්—O—(2, 2—ඩයික්ලෝරොවයිනිල්) පොස්පේටයෙන් සැදි මිශ්‍රණයක් ද අන්තර්ගත වේ.

හිමිකම් ප්‍රකාශ 2 ක් ද නිදසුන් 5 ක් ද මෙහි ඇතුළත් වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ත්‍රාර්.

1966 සැප්තැම්බර් 23 වැනි දින,
කොළඹ දී ය.

12—958/2

### දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**1965 මැයි 24 වැනි දින දරන අංක 5633 (ස්විට්සර්ලන්තයේ අංක 6857/64 දරන පේටන්ට් බලපත්‍රයේ 64.5.26 පූර්වතා දිනයට හිමිකම් පාන සම්මුති ඉල්ලුම් පත්‍රය)**


SANDOZ LIMITED

''1, 6–ඩයිමෙතිල් -$\Delta^{8,9}$- අර්ගොලීන් -8- කාබොක්සිලික් අම්ල පිළිබඳ ව වැඩි දියුණු කිරීම''

සංක්ෂේපය :—

මෙම නව නිර්මාණයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කරගත හැකි වේ :—


1 වැනි පොදු සූත්‍රයෙන් දැක්වෙන සංයෝග නිෂ්පාදනය සඳහා ක්‍රියාවලියකි.




I

මෙහි $R_1$ යනු එක්කෝ හයිඩ්‍රජන් පරමාණුවකි, නැති නම් කාබන් පරමාණු 1 සිට 4ක් තෙක් ගණනක් ඇති ඇල්කිල් ඛණ්ඩකයකි. $R_3$ යනු කාබන් පරමාණු 1 සිට 4ක් තෙක් ගණනක් ඇති ඇල්කිල් ඛණ්ඩකයක් හෝ කාබන් පරමාණු 2 සිට 6ක් තෙක් ගණනක් ඇති හයිඩ්‍රොක්සි ඇල්කිල් ඛණ්ඩකයක් හෝ කාබන් පරමාණු 4 සිට 6ක් තෙක් ගණනක් ඇති සයික්ලොඇල්කිල් ඛණ්ඩකයක් හෝ කාබන් පරමාණු 1 සිට 4ක් තෙක් ගණනක් ඇති ඇල්කිල් ඛණ්ඩකයක් මගින් 1–ස්ථානයේ ආදේශිත වූ පිපෙරිඩිල්–4 ඛණ්ඩකයක් හෝ වේ. එසේත් නැතිනම් $R_1$ සහ $R_2$ එකතුව නයිට්‍රජන් පරමාණු වද සමඟ පිපෙරිඩිනෝ ඛණ්ඩකයක් සාදයි. මේ ඛණ්ඩකයට හයිඩ්‍රොක්සි ඛණ්ඩකයක් විකල්ප වශයෙන් සම්බන්ධ වී තිබෙන්නට පුළුවන. යථෝක්ත සංයෝගවල අම්ල ආකලන ලවණත් මෙහි දී සාදනු ලැබේ. මෙම ක්‍රියාවලියේ ලක්ෂණ මෙසේ ය.


(a) II වැනි පොදු සූත්‍රයෙන් දැක්වෙන සංයෝග ගෙන ද්‍රව ඇමෝනියා තුළ දී භාස්මික සංඝනන කාරකයක් ඉදිරියේ මෙතිල් අයඩයිඩ සමඟ ප්‍රති ක්‍රියා කරවනු ලැබේ.



II

මෙහි $R_1$ සහ $R_2$ ඉහත පෙන්වා දුන් පරිදි ම වේ. තවත් ක්‍රමයක් නම්,

(b) 1,6—ඩයිමෙතිල් $\Delta^{8,9}$ — අර්ගොලීන්—8—කාබොක්—සිලික් අම්ල ක්ලෝරයිඩ් හයිඩ්රොක්ලෝරයිඩය ගෙන අක්‍රිය ද්‍රාවකයක් තුළ දී, III වැනි පොදු සූත්‍රය දරන ඇමයිනයක් සමඟ ප්‍රතික්‍රියා කරවීමයි.



III

මෙහි $R_1$ සහ $R_2$ ඉහත පෙන්වා දුන් පරිදි ම වේ. මෙවායින් හට ගන්නා, 1වැන්නෙන් පෙන්වන සංයෝග අවශ්‍ය නම් කාබනික හෝ අකාබනික හෝ අම්ල සමඟ ප්‍රතික්‍රියා කරවා එකී සංයෝගවල අම්ල ආකලන ලවණ සාද ගනු ලැබේ.

හිමිකම් ප්‍රකාශ 14ක් ද නිදසුන් 8ක් ද මෙහි ඇතුළත් වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ත්‍රාර්.

1966 සැප්තැම්බර් 18 වැනි දින කොළඹ දී ය.

12–958/3

---

## දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

1964 ජූනි 9 වැනි දින දරණ අංක 5453

TRUMAN BENJAMIN WAYNE

''හාල් පැහීම''

**සංක්ෂේපය :—**

මෙම නව නිර්මාණයේ සවභාවය මෙහි පහත කියැවෙන 1 වැනි සහ 2 වැනි හිමිකම් ප්‍රකාශවලින් නිශ්චය කරගත හැකි වේ :—

1. නිවුඩු හාල් පාහින ක්‍රමයක් වූ මෙය නිවුඩඩ මෘදු කිරීම සඳහා ගන්නා ද්‍රවකාරකයක් සමඟ ඒ නිවුඩු හාල් මිශ්‍ර කිරීමේ පියවරවලින් සමන්විත වේ. හාල් ඇට මත වූ නිවුඩඩ මෘදු කිරීමට සෑහෙන තරම් ප්‍රමාණයකින් ඒ ද්‍රව්‍යය යෙදිය යුතු ය. නිවුඩඩ මෘදු කිරීම පිණිස යොදන එම කාරකය මධ්‍යයේ දී හාල් පාහිනු ලැබේ.

2. 1 වැනි හිමිකම් ප්‍රකාශයට අනුව යෙදෙන ක්‍රියාවලියක් වූ මෙය පහත දක්වෙන අමතර පියවරවලින් තව දුරටත් ලාක්ෂණික වී ඇත: හාල් පැහෙන අවස්ථාවේ දී නිවුඩඩ ද හාල් ද ඉවතට ගෙන හාල්වලින් නිවුඩු ඉවත් නොකර නිස්සාරක පියවරකට එය පත් කිරීම; නිවුඩඩෙහි ද ජීවාණුවෙහි ද වූ මේද කොටස් සහ වර්ණ ද්‍රව්‍ය නිස්සාරණය කරගැනීමට සමත් ද්‍රාවකයක් යොදා නිවුඩුවලින් සහ හාල්වලින් යුත් එකී මිශ්‍රණය නිස්සාරණය කිරීම; මේද කොටස් සහ වර්ණ ද්‍රව්‍ය අන්තර්ගත ඒ ද්‍රාවකය හාල්-නිවුඩු මිශ්‍රණයෙන් වෙන් කිරීම; ඒ ද්‍රාවකයෙන් හාල් තෙල් ඉවත් කිරීම; හාල්-නිවුඩු මිශ්‍රණයෙන් ද්‍රාවකය වෙන් කිරීම හා නිවුඩඩෙන් හාල් අහක් කිරීම.

හිමකම් ප්‍රකාශ 14ක් ද රූ සටහන් පත් 4ක් ද මෙහි ඇතුළත් වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ත්‍රාර්.

1966 සැප්තැම්බර් 23 වැනි දින,
කොළඹ දී ය.

12–958/4

---

## දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

1964 ජූනි 22 වැනි දින දරන අංක 5467

IMPERIAL CHEMICAL INDUSTRIES LIMITED

''පැළෑටිනාශක ද්‍රව්‍ය නිෂ්පාදනය''

**සංක්ෂේපය :—**

මෙම නව නිර්මාණයේ සවභාවය මෙහි සහත කියැවෙන 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කරගත හැකි වේ :—

4,4[1]—බයිපිරිඩිලියම් චාතුර්ථ ලවණය සාදන ක්‍රියාවලියකි. ජලය ඉදිරියේ දී චාතුර්ථ කාරකයක් සමඟ 4,4[1]—බයිපිරිඩිල් ප්‍රතික්‍රියා කරවීම එම ක්‍රියාවලිය වේ.

හිමිකම් ප්‍රකාශ 24 ක්ද නිදසුන් 32 ක්ද මෙහි ඇතුළත් වේ.

එස්. එල් ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ත්‍රාර්.

1966 සැප්තැම්බර් 23 වැනි දින,
කොළඹ දී ය.

12–958/5

---

## දැන්වීමයි

පහත සඳහන් විශේෂ විස්තරය පිළිගෙන තිබේ :—

**1964 ජූලි 14 වැනි දින දරන අංක 5474. (ජපානයේ අංක 38819/63 දරන පේටන්ට් බලපත්‍රයේ 63.7.18 පූර්වතා දිනයට හිමිකම් පාන සම්මුති ඉල්ලුම් පත්‍රය)**

TEIJIN LIMITED

'' ජලභීතිකා තන්තු සඳහා ප්‍රතිරෝධක මුද්‍රණ ක්‍රමය ''.

**සංක්ෂේපය.**—මෙම නව නිර්මාණයේ ස්වභාවය මෙහි පහත කියැවෙන 1 වැනි හිමිකම් ප්‍රකාශයෙන් නිශ්චය කරගත හැකි වේ :—

ජලභීතිකා තන්තු ප්‍රතිරෝධක මුද්‍රණයට ලක් කිරීමේ ක්‍රමයක් වූ මෙහි දී අඩු ගණනේ එක වර්ගයක වත් අපකිරණ සායමක් යොදා ඒ ජලභීතික තන්තු සායම් පොවනු ලැබේ. මේ සායම් වර්ගයේ අණුව තුළ අඩු ගණනේ බණ්ඩක දෙකක් වත් අන්තර්ගත වන අතර ඒ එක එකේ හවුල් නොවූ ඉලෙක්ට්‍රෝන යුගලක් බැගින් දරනු ලැබේ. ලෝහ සන්දංශික (chelate) සංයෝග සෑදීමට මේ ඉලෙක්ට්‍රෝනවලට පුළුවන. ප්‍රතිරෝධ—කාරකය වශයෙන් ප්‍රතිරෝධක මුද්‍රණ තලපය භාවිත කිරීම මෙම ක්‍රියාවලියේ ලක්ෂණය වේ. එකී අපකිරණ සායම් සමඟ සන්දංශික සංයෝග සෑදීමේ හැකියාව ඇති ලෝහ සංයෝග එකී ප්‍රතිරෝධක තලපයේ අන්තර්ගත වේ.

හිමිකම් ප්‍රකාශ 8 ක්ද නිදසුන් 14 ක්ද මෙහි ඇතුළත් වේ.

එස්. එල්. ද සිල්වා,
පේටන්ට් බලපත්‍ර රෙජිස්ත්‍රාර්.

1966 සැප්තැම්බර් 23 වැනි දින,
කොළඹ දී ය.

12—958/6

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිඬ කරන්නාගේ වගකීම පිට‍ය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට හෝ පුළුවන.

3. **පෝය දිනවලට පෙර දින පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද, වෙනත් දිනවල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වාද** කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. **පෝය දිනවලට පෙරදින දවල් 12 ට සහ වෙනත් දිනවල පස්වරු 3.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.**

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් **හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති** නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. **වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස්** කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. **උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ රෙජිස්ට්‍රාර් මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඬ කරනු නො ලැබේ.**

10. 1966 මාර්තු මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු **මෙසේ යි :—**

| | | | රු. | ශ. |
|---|---|---|---|---|
| **අඟලකට හෝ ඉන් අඩුව** | ... | ... | 15 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට | ... | ... | 15 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | 165 | 0 |
| **තීරු** දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | 330 | 0 |

**අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.**

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

**12. 1966 මාර්තු 1 වෙනිදා සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

**13. 66.7.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—**

ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික

| | | | මෙරට රු. | මෙරට ශ. | | පිටරට රු. | පිටරට ශ. |
|---|---|---|---|---|---|---|---|
| **එක් කොටසක්** | ... | ... | 36 | 0 | ... | 49 | 0 |
| I වැනි කොටසේ **එක ඡේදයක්** | ... | ... | 26 | 0 | ... | 31 | 50 |
| I වැනි කොටසේ ඡේද දෙකක් | ... | ... | 33 | 50 | ... | 41 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. | මිළ ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. | තැපැල් ගාස්තු මෙරට ශ. |
|---|---|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී එක කොටසක් ... ... ... | 0 | 40 | ... | 0 | 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 0 | 80 | ... | 0 | 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 20 | ... | 0 | 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 | 40 | ... | 0 | 15 |

**දායක මුදල් බාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1966**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| අගෝස්තු ... | 66. 8.19 | සිකුරාද ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් ... | 66. 9. 2 | සිකුරාද ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් ... | 66.10. 7 | සිකුරාද ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් ... | 66.12. 2 | සිකුරාද ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව 3.30 |

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජූලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.